NARA

# ජාතික ජලජ සම්පත් නියෝජිතායතනය

# தேசிய நீரியல்வள முகாமை

# NATIONAL AQUATIC RESOURCES AGENCY

# 1982

## වාර්ෂික වාර්තාව සහ ගිණුම්

## வருடாந்த அறிக்கையும் கணக்கும்

## ANNUAL REPORT AND ACCOUNTS

## සභාපතිවරයාගේ වාර්තාව

1982 ජනවාරි 1 වැනි දින ජාතික ජලජ සම්පත් නියෝජිතායතනයේ පාලක සභාව පහත සඳහන් අයගෙන් සමන්විත විය.

අ. ගරු අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබුවෝ:

ආචාර්ය පිරාන් ඩබ්ලිව් ජයවර්ධන මහතා - සභාපති
මහාචාර්ය කේ.ඩී. අරුද්ප්‍රගාසම් මහතා
ආර්. භුවනේන්ද්‍රන් මහතා
මහාචාර්ය එච්.එච්. කෝස්තා මහතා
මහාචාර්ය ජේත ද සිල්වා මහතා
එච්. විපුවලංගම් මහතා
වෛද්‍යාචාර්ය ඊ.සී.එම්. වාස් මහතා
ආචාර්ය එච්.එම්.ජේ.ඩබ්. හේරත් මහතා

ආ. නිලබලයෙන් පත්වූවෝ:

අනුර වීරරත්න මහතා
ලේකම්, ධීවර අමාත්‍යාංශය,
ජස්ටින් ඩයස් මහතා,
ලේකම්, කර්මාන්ත හා විද්‍යාත්මක කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.
ආචාර්ය ආර්. මහාලංගෙවම් මහතා
මුදල් අමාත්‍යාංශයේ නියෝජිත
ඇලෝයි ඩබ්ලිව් ප්‍රනාන්දු මහතා,
වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්.

1982 ජූනි 1 වැනි දින ආචාර්ය ධනිල් පෙරේරා මහතා නියෝජිතායතනයේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් පත් කරනු ලැබීය.

පාලක සභාවේ අංක 9 සිට 25 දක්වා වන රැස්වීම් 17 ක් පිළිවෙළින්, ජනවාරි 26, පෙබරවාරි 3, පෙබරවාරි 17, මාර්තු 5, මාර්තු 19, අප්‍රියෙල් 7, අප්‍රියෙල් 22, මැයි 11, මැයි 21, ජූනි 4, ජූනි 22, ජූලි 22, අගෝස්තු 12, සැප්තැම්බර් 10, ඔක්තෝබර් 8, නොවැම්බර් 26 හා දෙසැම්බර් 27 යන දිනයන්හි පැවැත්විණි.

පාලක සභාවේ රැස්වීම්වලදී සාකච්ඡා කැරුණු හා තීරණ ගනු ලැබූ වඩා වැදගත් කරුණු වලින් සමහරක් පහත පළවේ:

1. විසිතුරු මසුන් සඳහා ලෝක වෙළඳපොළ ශක්‍යතාවය ඇගැයුම් කිරීම හා විසිතුරු මසුන් කර්මාන්තය සංවර්ධනය කිරීමට උපාය මාර්ගයක් සකස් කිරීම.

2. 2. විසිතුරු මසුන් ඇතිකිරීම පිළිබඳ ප්‍රදර්ශන ස්ථානයක් පිහිටුවීම

3. ජෛවික සම්පත් පර්යේෂණ වැඩ සටහනක් සකස් කිරීම.

4. සමුද්‍රීය පරිසරය හා සම්බන්ධිත පරිසරය ආරක්ෂා කිරීම සඳහා වන ආ.වි.සං.ආ.වැ. කලාපීය ව්‍යාපෘතිය.

5. පරාක්‍රම සමුද්‍රයේ මත්ස්‍ය විද්‍යාත්මක ව්‍යාපෘතිය තවදුරටත් කරගෙනයෑම

6 මුහුදු නිෂ්පාදනවල තත්ව පාලන රසායනාගාරයක් පිහිටුවීම.

7. කැවි පුත්පුත්වීම පිළිබඳ අධ්‍යයනයක්

8. පර්යේෂණ මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා කල්පිටියේ ඉඩමක් බද්දට ගැනීම.

9. පර්යේෂණ හා සංවර්ධන කටයුතු පිළිබඳ ජාතික වැඩ මුළුවක් පැවැත්වීම.

ආචාර්ය හිරාන් ඩබ්ලිව් ජයවර්ධන
සභාපති.

# 1982 කාර්ය සාධනය පිළිබඳ වාර්තාව

ජාතික ජලජ සම්පත් නියෝජිතායතනය 1981 සැප්තැම්බර් මාසයේදී පාර්ලිමේන්තු පනතක් මගින් සංස්ථාපනය කරනු ලැබීය. කෙසේවුවද පර්යේෂණ වැඩ සටහන සකස් කිරීම සඳහාත් ක්‍රියාත්මක කිරීම සඳහාත් සැලකියයුතු කාලසීමාවක් ගතවිය. එවකටත් පැවැති අංශ කිහිපයක් හැරුණු විට අනික් අංශ සඳහා වූ පර්යේෂණ වැඩ සටහන නියෝජිතායතනයේ විද්‍යාත්මක හා තාක්ෂණික කමිටුඅව විසින් සකස් කර අනුමත කරනු ලැබුවේ 1982 මැයි මාසයේදී ය.

1982 දී මෙම නියෝජිතායතනයේ පර්යේෂණ අංශ විසින් ක්‍රියාත්මක කරන ලද පර්යේෂණ ව්‍යාපෘතින්ගේ ලේඛණයක් පහත දක්වා ඇත.

## 1. සමුද්‍රීය ධීවර අංශය:

### අ. මාදැල් ධීවර කර්මාන්තය හා කුඩා තරමේ දැල් ධීවර කර්මාන්තය කෙරෙහි විශේෂ අවධානයක් ඇතිව වෙරළාසන්න ධීවර කර්මාන්තය පිළිබඳ අධ්‍යයනය.

බටහිර වෙරළේ මාදැල් ධීවර කර්මාන්තයේ ඇරඹීමත් සමග වෙරළාසන්න ධීවර කර්මාන්තය අධ්‍යයනය ඔක්තෝබර් මාසයේදී පටන් ගනු ලැබීය.

### ආ. කෙළවල්ලන් ඇල්ලීම පිළිබඳ අධ්‍යයනය

මෙම ව්‍යාපෘතිය ජූනි මාසයේදී අරඹනු ලැබූ අතර, ආරම්භක අධ්‍යයනය කන්දකුලිය සිට කිරින්ද දක්වා වන දිවයිනේ බටහිර කොටසට සීමා කෙරිණ. මේ ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථයවනුයේ අගත කෙළවල්ලා සම්පත උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගැනීම අවසාන අරමුණ කර ගෙන එම, මසුන්ගේ සංක්‍රමණික රටාව අධ්‍යයනය කිරීමය.

### ඇ. ඉස්සන් ඇල්ලීම පිළිබඳ අධ්‍යයනය

ඉස්සන් ඇල්ලීම පිළිබඳ අධ්‍යයනය මෝදර, මීගමුව හා හලාවත යන ස්ථානයන්හි සිදු කෙරිණි. ඉස්සන්ඇල්ලීමෙහි සංයුතිය, අතුරු ඇල්ලුම, ඉස්සන්ගේ ගැහැණු පිරිමි බව හා පරිණත බව තහවුරු කර ගැනීම සඳහා ඉස්සන් මාසිකව ආදර්ශණය කිරීම මේ කාර්යයට ඇතුලත්විය.

## 2. මත්ස්‍ය තාක්ෂණික ආයතනය:

මේ නියෝජිතායතනය සංවිධානය කරනු ලැබීමට පෙරද, මෙම අංශය පැවතුනි. 1982 වර්ෂය මුළුල්ලේම මේ ආයතනයේ පර්යේෂණ වැඩ සටහන නොකඩවා ක්‍රියාත්මකවූ අතර, එම අංශය විසින් භාරගනු ලැබූ ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් ලබා ඇති ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ:-

### අ. සමුද්‍රීය නිෂ්පාදනවලට අදාල තත්ව පාලන කටයුතු:

මෙම ව්‍යාපෘතිය සම්බන්ධ කාර්යය අපනයනය කෙරෙන සමුද්‍රීය නිෂ්පාදනවල තත්වය දියුණු පවුණු කිරීමෙහිලා අදාලවිය. මෙහිලා නැව්ගත කිරීමට පෙර සියළුම සමුද්‍රීය නිෂ්පාදිත ක්ෂුද්‍රජීව විද්‍යාත්මක පරීක්ෂණයට භාජන කිරීම සඳහා වෙනම රසායනාගාරයක් සංවිධානය කි කිරීමට විධිවිධාන සලසනු ලැබ තිබේ.

**ආ. සම්ප්‍රදායික ධීවර නිෂ්පාදනවල තත්වය දියුණු කිරීම.**

අසුරා තබාගතහැකි කාලය දික්කිරීමේ අරමුණ ඇතිව ජාඩිවැනි සම්ප්‍රදායික වශයෙන් සකස් කැරෙන මත්ස්‍ය නිෂ්පාදනවල මුඩුවීම හා පුස්වැඩීම වළකාලීමට ප්‍රතිඔක්සිකාරකයන් පුස් නිශේධකයන් භාවිතා කිරීමෙන් එම නිෂ්පාදනවල තත්වය දියුණු කිරීමේ අදහසින් මේ ව්‍යාපෘතිය අරඹනු ලැබීය.

**ඇ. ගබඩා කිරීමේ විවිධ තත්වයන් යටතේ තෙත් මාළුවල තත්වය හා අසුරා තැබිය හැකි කාලය:**

ඉතා දීර්ඝ කාලසීමාවන් සඳහා තෙත්මාළු ගබඩා කර තැබීමට හැකි ඉතා සුදුසු තත්වයන් නිගමනය කරනු වස් කටයුතු ඇරඹීම මේ ව්‍යාපෘතියේ කාර්යයන්ට ඇතුලත්විය.

**ඈ. ඇසුරුම් ද්‍රව්‍ය හා ටින් කිරීම සඳහා ආලේපයන් වෙනුවට භාවිතා කැරෙන ක්‍රම:**

මසුන් හා මත්ස්‍ය නිෂ්පාදන ටින් කිරීමේ කර්මාන්තයේදී ටින් වෙනුවට අදාල ද්‍රව්‍යයෙන් සාදනු ලබන උර භාවිත කෙරෙන හෙයින් විෂබීජ හරණයට දරා සිටියහැකි උෂ්ණයට ඔරොත්තු දෙන සුදුසු ද්‍රව්‍යයක් සොයා ගැනීම මේ ව්‍යාපෘතියේ කටයුතුවලින් අරමුණු කෙරේ. මේ උර භාවිතා කෙරෙමින් සාලයන් හා හුරුල්ලන් මිරිස් හා තක්කාලි සෝස් දියරයෙහි ලා ඇසිරීමේ හැකියාව පරීක්ෂණ වලින් හෙලිවී ඇත.

**ඉ. මත්ස්‍ය ජල විච්ඡේදකයන් පිලියෙල කිරීමේදී පැපේන් හා බ්‍රෝමිලේන් ප්‍රයෝජනයට ගැනීම**

කාරල්ලන්ගෙන් හා ඉවතලන වෙනත් මසුන් වර්ගවලින් පිලියෙල කැරෙන මත්ස්‍ය සාරයන්ගේ ජල විච්ඡේදනය කිරීමට යෙදිය හැකි ජල විච්ඡේදක එන්සයිම වශයෙන් පැපේන් හා බ්‍රෝමිලේන් යොදනු ලැබේ.

සංශුද්ධ කරනු ලැබූ විට මේ මත්ස්‍ය ජල විච්ඡේදිතයන් මාමයිට්, විම්ටයිට් ආදී එළවළු සාරයන්ට බෙහෙවින් සමානවේ. මේ නිෂ්පාදනයෙහි තරමක් තිත්ත රසයක් තිබූ බැවින් ඒවාහි අප්‍රසන්න රසයන් අඩු කරලීම සඳහා දැනට අධ්‍යයනයක් කෙරේ.

**ඊ. පොළොන්නරුවේ මාළු පිලටි සකස් කිරීමේ හා මාළු කෑම නිපදවීමේ යන්ත්‍රාගාරය**

පර්යේෂණ කාර්ය මණ්ඩලය ඉහත යන්ත්‍රාගාරය ක්‍රියාත්මක කිරීමේ තාක්ෂණික කටයුතුවල නිරතව සිටි අතර, එම නිෂ්පාදනාගාරයේ කටයුතු 1983 පෙබරවාරි මුල් කොටසේදී ආරම්භ වනු ඇත.

## 3. ගොඩතර ජලජ සම්පත් ඒකකය.

මේ අංශය විසින් 1982 ජූනි සිට දෙසැම්බර් දක්වා කාලය තුලදී ප්‍රධාන ව්‍යාපෘති තුනක් භාරගනු ලැබීය. එම ව්‍යාපෘතිවල ප්‍රගතිය පහත දැක්වේ.

**අ. පුත්තලම් කලපු ව්‍යාපෘතිය**

මෙය වනාහි ජල ජෛව විද්‍යාත්මක අධ්‍යයනයන් කලපු ධීවර කර්මාන්තයේ වර්තමාන තත්ත්වය හා ශක්‍යතා වන් විමර්ශණය කිරීම, කඩොලාන ශාකය හා ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික සමීක්ෂණය වැනි පුත්තලම් කලපුවේ අංශ ගණනාවක් ආවරණය කැරෙන ඒකාබද්ධ ව්‍යාපෘතියකි.

**ආ. පොලොන්නරුව දිස්ත්‍රික්කය ප්‍රධාන ජලාශවල මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය පිළිබඳ අධ්‍යයනයන්.**

මෙම ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබුවේ පොලොන්නරු දිස්ත්‍රික්කයේ ප්‍රධාන ජලාශවල මත්ස්‍ය නිෂ්පාදන මට්ටම් නිශ්චය කරගනු පිණිසය. මේ සම්බන්ධයෙන් කරගෙන යනලද කටයුතුවලට මත්ස්‍ය නිෂ්පාදනය හා ප්‍රයත්නය පිළිබඳවද වාණිජමය වශයෙන් වැදගත්වන මත්ස්‍ය වර්ගවල වර්ග සංයුතිය හා ප්‍රමාණ සංයුතිය පිළිබඳවද මාසික දත්ත රැස්කිරීම ඇතුලත්විය.

**ඇ. මෑද්වංගි වගා ව්‍යාපෘතිය**

ත්‍රිකුණාමලයේද පහුරු දෙකක් යෙදවීමෙන් මේ ව්‍යාපෘතිය 1982 නොවැම්බරවලදී ආරම්භවිණි. මෑදවංගි වගාව පිළිබඳ විස්තරාත්මක ව්‍යාපෘති යෝජනාවක් සකස් කරනු ලැබ මුදල් සැපයුම සඳහා ජා.සං.ප.ම.ට ඉදිරිපත් කරන ලදී. දිවයිනේ වෙරළ තීරුව දිගේ මෑදවංගි වගාව සඳහා සුදුසු ස්ථාන පිහිටුවීම පිණිස මූලික විමර්ශණයන්ද පැවැත්වීම සිදුවේ.

4. **සාගර විද්‍යා ඒකකය:**

මෙය කිම් නියෝජිතායතනය යටතේ සංවිධානය කෙරුණු නව අංශයකි. එහෙයින් මේ අංශය විසින් ක්‍රියාත්මක කලයුතුවන පර්යේෂණ ව්‍යාපෘතීන් හඳුනාගැනම හා සකස් කිරීම සඳහා සෑහ සැලකියයුතු කාලසීමාවක් නිකැප කිරීමට සිදුවිය.

සමාලෝචනයට භාජනවන කාලසීමාව තුළදී මේ අංශය විසින් පහත දැක්වෙන කාර්යයන් ඉටුකිරීම භාරගනු ලැබීය.

අ. අක් වෙරළ ප්‍රදේශයේ ඛනිජ ගවේෂණය පිළිබඳව පොත්පත් ඇසුරෙන් සමීක්ෂණය කිරීම.

ආ. මහාද්වීපික තටකය ද ඇතුලත්ව ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශවල සම්පත් ශක්‍යතාවයන් ඇගැයුම් කිරීම සඳහා පොත්පත් ඇසුරෙන් සමීක්ෂණය කිරීම.

5. **සංඛ්‍යාලේඛණ හා දත්ත සැකසීම**

මෙම අංශය විසින් පහත දැක්වෙන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරනලදී.

අ. **හලාවත කරුප්පනී ව්‍යාපෘතිය**

ආ. **යාපනය කරෙයිනගර් ව්‍යාපෘතිය**

ධීවර දත්ත රැස් කිරීම සඳහා අදාල කර ගැනෙන ක්‍රම දියුණු කරනු වස් මෙම ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරනලදී.

ඇ. **හම්බන්තොට ව්‍යාපෘතිය හා සමාජ ආර්ථික සමීක්ෂණය**

මෙය වූ කලී ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්වයන් නිරණය කරනු සඳහා නෝරාඩ් ආයතනයේද සහයෝගය ඇතිව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘතියෙකි.

ඇ. පුස්තකාලය.

මෙම අංශයේ නිලධාරීහු පුස්තකාලය සංවිධානය කිරීමෙහි ලා ද නිරතවූහ.

6. සේවයෙන් හා මෙහෙයුම්

මේ නියෝජිතායතනයේ අනික් අංශවලට අවශ්‍ය සේවාවන් සැපයීම මේ අංශයේ කාර්යයන්ට ඇතුලත්විය.

7. විශේෂ ව්‍යාපෘතීන්

සමාලෝචනයට භාජනවන කාලසීමාවතුලදී පහත දැක්වෙන විශේෂ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක ෙකෙරිණි.

අ. විසිතුරු මසුන් ඇල්ලීම.

ආ. සම්ප්‍රදායික නොවන ජලජ ආහාර ද්‍රව්‍ය සංවර්ධනය

ඇ. පුපුරන ද්‍රව්‍ය ආධාරයෙන් මසුන් ඇල්ලීම.

ඈ. සමුද්‍රීය උයන්

ඉ. වෙරළබඩ ප්‍රදේශ පිළිබඳ සෝදිනි සමීක්ෂණ

ඊ. ...රා කලපුව සංවර්ධන

උ. තල්මසුන් හා සමුද්‍රීය ක්ෂීරපායි සතුන්

ඌ. පරිසර අධ්‍යයනයක්.

1983 ජනවාරි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව

ටොරින්ටන් චතුරශ්‍රය,
කොළඹ 7.

1984.12.08.

සභාපති,
ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා
සංවර්ධන නියෝජ්‍යායතනය.

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජ්‍යායතනයේ
1982 දෙසැම්බර් 31 වෙනි දිනෙන් අවසන් වර්ෂයේ ගිණුම් පිළිබඳව
1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය අනුව
විගණකාධිපතිගේ වාර්තාව.

1982 දෙසැම්බර් 21 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජ්‍යායතනයේ ගිණුම් පිළිබඳ විගණනය 1971. අංක 38 දරණ මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංග්‍රහයේ 154(1) ව්‍යවස්ථාව අනුකූලව මගේ නියමය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය අනුව නියෝජ්‍යායතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රසිද්ධ කළයුතු යයි සිතෙන මගේ නිරීක්ෂණයන් ඉහත ඡේදයන්හි ඇක්වේ. මුදල් පනතේ 13(7) (එ) වගන්තිය ප්‍රකාරව සවිස්තරයක් මත වාර්තාවක් ආයතනයේ සභාපති, ධීවර අමාත්‍යාංශයේ ලේකම් සහ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් වෙත 1984 ජුනි 15 වැනි දින ඉදිරිපත් කරන ලදී.

1:2 <u>විගණන විෂය පථය:</u>

මෙම වාර්තාවේ අඩංගු විගණන මතය, අදහස් දැක්වීම්, සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මුදල්මය ප්‍රකාශයන් පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනු පිළිබඳ නියැදි පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනයන්ගේ හා පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රකාශන මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, සම්පත් සහ කාලවේලා ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කලහැකි පරිදි පිළියෙල කරන ලද්දකි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1981 අංක 38 දරණ මුදල් පනතේ 13 (3) සහ (4) යන වගන්තිවලින් විගණකාධිපති වරයාට අභිමතානුසාරී බලතල පැවරේ.

2. <u>ගිණුම්:</u>

2:1 <u>ගිණුම් ඉදිරිපත් කිරීම:</u>

1982 දෙසැම්බර් මස 21 වෙනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් විගණනයට ඉදිරිපත් කරන ලද්දේ 1983 සැප්තැම්බර් 26 වෙනි දිනය. පසුව සංශෝධනය කරන ලද ගිණුම් 1983 දෙසැම්බර් 15 වෙනි දින විගණනයට ඉදිරිපත් කරන ලද්දේ කලින් ඉදිරිපත් කරන ලද ගිණුම් අවලංගු කරන ලද සේ සලකන්න යයි කරන ලද ඉල්ලීමක් පමණය. මෙම වාර්තාවේ අඩංගු අදහස් දැක්වීම් 1983 දෙසැම්බර් මස 15 දින ඉදිරිපත් කරන ලද සංශෝධිත ගිණුම් සම්බන්ධයෙන් වේ.

/2...

2:2 **විගණන මතය:**

මෙම වාර්තාවේ අඩංගු අදහස් දැක්වීම් අනුව ඉදිරිපත් කර ඇති ගිණුම් සම්බන්ධයෙන් මතයක් මට ප්‍රකාශ කළ නොහැක.

2:3 **මුදල්මය ප්‍රතිඵල:**

ගිණුම් වලට අනුව 1982 දෙසැම්බර් 31 වෙනි දිනෙන් අවසන් වර්ෂය සඳහා නියෝජ්‍යායතනයේ වැඩ කටයුතු වල ප්‍රතිඵලය වූයේ රු.39,28,149 ක වියදමට වැඩි ආදායමක් වූ අතර, 1981 සැප්තැම්බර් 16 වෙනි දින සිට දෙසැම්බර් 31 වෙනි දින දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා මීට අනුරූපීකවූ මුදල රු.2,35,067 කි. මුදල්මය ප්‍රතිඵල ගණන් බලා ඇත්තේ, 1983 ජනවාරි 31 වෙනි දින ලැබුන රු.13,00,000 ඇතුළු රජයේ මුළු දායක මුදල වූ රු.78,00,000 වර්ෂයේ ආදායම වශයෙන් සලකා ගෙනය. කෙසේ වෙතත්, ඉකුත් කාල පරිච්ඡේදයේදී රජයේ දායක මුදල වූ රු. 71,34,000 ක් රු.9,53,000 ක් පමණක් ආදායම වශයෙන් ගිණුම් වල පෙන්වා ඇත.

ඉදිරිපත් කර ඇති ගිණුම් අනුව 1982 දෙසැම්බර් 31 වෙනි දිනෙන් අවසන් වර්ෂය සහ 1981 සැප්තැම්බර් 16 වෙනි දින සිට දෙසැම්බර් 31 වෙනි දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා වූ මුදල්මය ප්‍රතිඵල පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| | 1982 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | | 1981 සැප්තැම්බර් 16 දින සිට දෙසැම්බර් 31 දින දක්වා වූ කාලය | |
|---|---|---|---|---|
| **ආදායම** | රු. | රු. | රු. | රු. |
| රජයේ දායක මුදල | 78,00,000 | | 9,53,000 | |
| විවිධ ආදායම් | 1,500 | 78,01,500 | - | 9,53,000 |
| **අඩුකලා: වියදම්:** | | | | |
| වැටුප හා වේතන | 38,16,459 | | 4,15,728 | |
| මණ්ඩලීය වියදම් | 11,708 | | 12,948 | |
| උපදේශක ගාස්තු | 26,597 | | - | |
| සංග්‍රහ වියදම් | 30,385 | | 584 | |
| ඉන්ධන | 39,042 | | 5,016 | |
| ප්‍රචාරන වියදම් | 73,987 | | 39,054 | |
| ආරක්ෂක සේවා | 87,537 | | - | |
| විදුලිය | 1,64,158 | | 60,000 | |
| ආයතන වියදම් | 4,13,650 | | 1,51,242 | |
| පරිපාලන වියදම් | 2,10,828 | (39,73,351) | 3,361 | (7,17,933) |
| | | 39,28,149 | | 2,35,067 |

3:4 <u>මුදල්මය ව්‍යුහයඃ</u>

1982 නොවැම්බර් මස 31 වෙනි දින නියෝජ්‍යායතනයේ මුදල්මය ව්‍යුහය 1982 දෙසැම්බර් 31 දිනට පැවති මුදල්මය ව්‍යුහය සමඟ සසඳා පහත දැක්වේ.

| | | | දෙසැම්බර් 31 වෙනි දිනට | | |
|---|---|---|---|---|---|
| සම්පත්: | | | | | |
| ජනවාරි 01 දිනට රජයේ ආයක මුදල | | | 71,34,000 | | |
| එකතුකලා: | | | | | |
| වර්ෂය තුලදී /සැප්තැම්බර් 16 දින සිට දෙසැ.31 දක්වා කාලපරිච්ඡේදයේදී ලැබුන මුදල (පුනරාවර්ථන සහ මූලධන ආයක මුදල් නඅයෝජනය වේ.) | | | 78,00,000 | | 71,34,000 |
| | | | 1,49,34,000 | | 71,34,000 |
| අඩුකලා: වියදුම් | | | | | |
| ඉදිරියට ගෙන ශේෂය | | 7,17,933 | | | |
| එකතුකලා: | | | | | |
| වර්ෂය සඳහා වියදම | 38,73,351 | | | | |
| අඩුකලා: විවිධ ආදායම් | 1,500 | 38,71,851 | (45,89,784) | 7,17,933 | 7,17,933 |
| | | | 1,03,44,216 | | 64,16,067 |
| යෙදවීම්: | | | | | |
| ස්ථාවර වත්කම් | | | 44,33,394 | | 19,290 |
| ජංගම වත්කම් | | 62,50,099 | | 65,42,614 | |
| අඩුකලා: | | | | | |
| ජංගම වත්කම් | | 3,39,277 | 59,10,822 | 1,45,937 | 63,96,777 |
| | | | 1,03,44,216 | | 64,16,067 |

2:5 – <u>අරමුදල් ප්‍රභවයන් සහ යෙදවීම්:</u>

සමාලෝචිත වර්ෂය තුල නියෝජ්‍යායතනයේ අරමුදල් වල ප්‍රභවයන් හා ඒවා යෙදවීම පහත ප්‍රකාශයෙන් දැක් වේ.

| | | |
|---|---|---|
| <u>ප්‍රභවයන්:</u> | | |
| වියදමට වැඩි ආදායම | 39,28,149 | |
| <u>එකතුකලා:</u> | | |
| අරමුදල් සංසරණය නොවන්නාවූ විෂයයන් වෙනුවෙන් ගැලපීම් | 1,929 | 39,30,078 |
| <u>ක්ෂය:</u> | | |
| <u>යෙදවීම්</u> | | |
| ස්ථාවර වත්කම් එකතු කිරීම | | (44,16,033) |

පහත විශ්ලේෂණය කර ඇති පරිදි
කාරක ප්‍රාග්ධනයේ අඩුවීම් (4,85,955)

කාරක ප්‍රාග්ධනය කෙරෙහි බලපෑම්

| | වැඩිවීම | අඩුවීම | |
|---|---|---|---|
| | රු | රු. | |
| වැඩිවීම- ණය ගැතියන් | 51,90,696 | - | |
| වැඩිවීම - අත්තිකාරම් හා තැන්පතු | 54,016 | - | |
| වැඩිවීම - ණය හිමියන් | - | 4,261 | |
| වැඩිවීම -, උපචිත වියදම් | - | 1,81,459 | |
| වැඩිවීම - තැන්පතු | - | 7,721 | |
| අඩුවීම - අතේ සහ බැංකුවේ - ඇති මුදල් | - | 55,35,226 | 4,85,955 |

2:6 - ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම:-

2:6:1 - රජයේ දායකය:-

(I) ගිණුම් වල සහ භාණ්ඩාගාර පොත්වල දක්වා ඇති මුදල් ගණන සම්බන්ධයෙන් පහත දැක්වෙන වෙනස්වීම් නිරීක්ෂණය විය.

| විෂය | ගිණුම් වල දක්වා ඇති මුදල | භාණ්ඩාගාර පොත් වල දක්වා ඇති මුදල |
|---|---|---|
| 1982 දෙසැම්බර් දක්වා රජයේ දායක මුදල | 1,49,34,000 | 1,26,81,000 |
| භාණ්ඩාගාර තැන්පත් ගැනුම් | - | 16,00,000 |
| භාණ්ඩාගාර තැන්පත් ගිණුම | 78,00,000 | 65,00,000 |

වෙනසට හේතු වී ඇත්තේ 1983 ජනවාරි මාසයේදී ලැබුන රු. 13,00,000 ක දායක මුදල සමාලෝචිත වර්ෂයේදී ලැබුන මුදලක් ලෙස වැරදි සහගත ලෙස ගණන් ගැනීම නිසාය.

(II) නියෝජ්‍යායතනය විසින් දායක මුදල් පුනරාවර්තන හා මූලධන වශයෙන් වෙන් කර නොමැති අතර, වර්ෂය සඳහා ආදායම වශයෙන් ගණන් තබා ඇත. කෙසේ වෙතත්, රජයේ දායක මුදල 1982 වර්ෂයේ ඇස්තමේන්තු වල ධීවර අමාත්‍යාංශය යටතේ පහත සඳහන් පරිදි වෙන් කර ඇත.

| | | | |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | - | 136-1-01(07) = | රු: 36,00,000 |
| මූලධන වියදම් | - | 136-1-103-11(3) = | රු: 45,00,000 |
| | | එකතුව | රු: 81,00,000 |

භාණ්ඩාගාරය විසින් නියෝජ්‍යායතනය වෙත මුදල් නිදහස් කිරීමේ ලිපිය අනුව මූලධන වැය ශීර්ෂයට (136-1-103-11(3)) හරකර ඇති මුදල රු.55,00,000 ක්වූ අතර, පුනරාවර්තන වියදම් සඳහා දායක මුදල රු: 10,00,000 කි. 1983 ජනවාරි මාසයේ නිදහස්කරන ලද රු. 13,00,000 ක මුදල පුනරාවර්තන වැය ශීර්ෂයට හරකර ඇත.

| | | |
|---|---|---|
| | | (v) ණය ගැතියන්ගේ කාල විශ්ලේෂණයක් නොතිබීම<br>(vi) බොල් ණය වෙනුවෙන් ප්‍රතිපාදන නොමැති වීම. |
| (ඇ) අත්තිකාරම් හා තැන්පත් | 100,891 | අත්තිකාරම් හා තැන්පත් වෙනුවෙන් ලේඛණයක් නොපැවැත්වීම. |
| (ඈ) ණය හිමියන් හා උපචිත වියදම් | 331,556 | (I) උපයෝගිතා චාර්ත හා පාලන ගිණුම් නොපැවැත්වීම.<br>(II) බැරකම් සහා ට කර නොතිබීම.<br>(III) පසුගිය කාලපරිච්ඡේදයේත් ඉදිරියට ගෙන රු.4,110 ක් වෙනුවෙන් විස්තරාත්මක උපලේඛන සකස් නොතිබීම. |
| (ඉ) පෞද්ගලික පඩිනඩි | 17,88,074 | (I) නියෝජ්‍යායතනයේ අනුමත කාර්ය මණ්ඩලයක් වැටුප් පරිමාවක් නොතිබීම.<br>(II) නිලධාරීන් ස්ථාපිත වැටුප් තලයන් පිළිබඳ විස්තර නොතිබීම. |
| (ඊ) බැංකු ශේෂයන් | 9,45,913 | සහාථ කිරීම් නොතිබීම. |

2:6:6 – <u>ප්‍රමාණ කල හැකි වැරදි:-</u>

විගණනයේදී යොයාගන්නා ලද ප්‍රමාණ කළ හැකි වැරදි නිසා ගිණුම් කෙරෙහි පහත සඳහන් බලපෑම් ඇතිවිය.

| | | |
|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රතිඵල අඩුවෙන් දැක්වීම | රු: 3,05,320 |
| (ආ) | ශුද්ධ වත්කම් අඩුවෙන් දැක්වීම | රු: 2,94,680 |
| (ඇ) | කාරක ප්‍රාග්ධන අඩුවෙන් දැක්වීම | රු: 7,56,000 |

3. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය:-</u>

3:1 –<u>මූල්‍ය ප්‍රතිඵල:</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය වශයෙන් වියදමට වැඩි ආදායම රු:39,28,149 ක්වූ අතර, 1981 සැප්තැම්බර් 16 වෙනි දින සිට දෙසැම්බර් 31 වෙනි දක්වා වූ පසුගිය කාලපරිච්ඡේදය සඳහා මීට අනුරූපී මුදල රු.2,35,067 ක් විය. ඉහත 2:3 ඡේදයේ සඳහන් කරන්නට යෙදුන පරිදි මෙයට ප්‍රධාන හේතුව වූයේ රජයෙන් ලැබුන මුළු දායක මුදල වන රු:78,00,000 වර්ෂයේ ආදායම වශයෙන් ගණන් ගැනීමත්, 2:6:2 ඡේදයේ සඳහන් කර ඇති පරිදි ගමන් වියදම්, ඉන්ධන, විදුරු භාණ්ඩ, පාරිභෝගික ද්‍රව්‍ය ආදිය සඳහා දරණ ලද වියදම් ප්‍රාග්ධන ගත කිරීමක් ය.

වැටුප් හා වේතන වශයෙන් ගෙවන ලද රු.28,16,459 ක් වූ මුදල මුළු වියදමින් 72% ක් නියෝජනය වූ අතර, ආයතන හා පරිපාලන වියදම වූ රු.6,24,478 කොහොත් 16% ක් විය. සමාලෝචිත වර්ෂයේදී නියෝජ්‍යායතනය විසින් ආරක්ෂිත සේවාවන් සඳහා රු.87,537 ක වියදමක් දරා ඇත.

3:2 : <u>ණය එකතු කිරීම:</u>

1981 දෙසැම්බර් 31 වෙනි දිනට හිඟ තිබූ රු.61,475 ක් වූ මුදලින් රු.8,580 ක [illegible]

2:6:2: **වියදම් මූලධන ගත කිරීම:**

ගමන් වියදම්, ඉන්ධන, විදුරු භාණ්ඩ සහ පාරිභෝගික ගබඩා ද්‍රව්‍ය ද සඳහා දරණලද රු.5,51,978 ක වියදම වැරදි සහගත ලෙස මූලධන ගත කර තිබ ඇත.

වියදම් මූලධන හා ආදායම් අතර වර්ග කරණය සම්බන්ධයෙන් ආයතනය විසින් ප්‍රති පත්තිමය තීරණයක් ගෙන නොමැති බව දක්නට ලැබුනද, ගමන් වියදම්, ඉන්ධන හා යැපීම් දීමනා ආදිය මූලධන ගත කර ඇත්තේ පුනරාවර්තන වියදම් සඳහා වෙන් කල මුදල් ප්‍රමාණවත් නොවෙන නිසාය. අදාල වියදම් මූලධන වියදම් සඳහා ප්‍රතිපාදන මුදලින් දරා ඇත.

2:3:6 **අමාත්‍යාංශයෙන් වත්කම් මාරු කිරීම:**

කලින් ධීවර අමාත්‍යාංශය යටතේ වූ ධීවර අභ්‍යාස සහ පර්යේෂණ ආයතනය සතුව තිබූ සියළුම දේපල නියෝජ්‍යායතනය මගින් අයත්කර ගෙන තිබෙන බවත්, පනතේ 35 වෙනි වගන්තිය ප්‍රකාරව මෙම දේපල නියෝජ්‍යායතනයට පවරාදීම සම්බන්ධයෙන් අදාල ගැසට් නිවේදනයක් නිකුත් කර නොමැති බව 1981 සැප්තැම්බර් 16 වෙනි දින සිට දෙසැම්බර් 31 වෙනි දක්වා වූ ගිණුම් සම්බන්ධයෙන් වූ මගේ වාර්තාවේ සඳහන් කරන්න ලදී. කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදී ද, කිසිදු පියවරක් ගෙන නොතිබුනි.

2:6:4 **උපචිත වියදම්:**

(I) පසුගිය වර්ෂයේ උපචිත වියදම් වශයෙන් දැක්වූ රු.26,507 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල්කර නොතිබුනි.

(II) 1981 සහ 1982 වර්ෂයන් සඳහා විගණන ගාස්තු වෙනුවෙන් ගිණුම් වල ප්‍රතිපාදන සලසා නොතිබුනි.

2:6: 5 **විගණනය සඳහා සාක්ෂි:**

පහත සඳහන් විෂයයන් එක් එක් විෂය ඉදිරියේ දක්වා ඇති හේතූන් නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට හෝ පිළි ගැනීමට හෝ නොහැකි විය.

| ගිණුම | වටිනාකම | හේතූන් |
|---|---|---|
| (අ) ස්ථාවර වත්කම් | 44,35,323 | (I) ස්ථාවර වත්කම් ලේඛණ තබන්නා නොකිරීම.<br>(II) වර්ෂය අවසානයේදී හෝ වර්ෂය තුලදී වත්කම් සරිවැරදි (භෞතික) නොබැලීම. |
| (ආ) විවිධ ණය ගැතියන් | 52,03,296 | (I) ගොඩනැගිලි වැඩිදියුණු කිරීම සඳහා අමාත්‍යාංශයට ගෙවන ලද රුපියල් දශ ලක්ෂ 05 ක් වෙනුවෙන් ගිවිසුමක් සහ පිරිවැය ඇස්තමේන්තුවක් නොතිබීම.<br>(II) පාලන ගිණුම් වෙනුවෙන් උපයෝගී වාර්තා පවත්වා නොතිබීම.<br>(III) ණය ගැතියන් සනාථ කරවා ගෙන නොතිබීම.<br>(IV) කලින් කාලපරිච්ඡේදයෙන් ඉදිරියට ගෙනා රු.52,895 සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛන නොතිබීම |

3:3 **ලේකම් කෙනෙකු පත් කිරීම:**

පනතේ 11 වෙනි වගන්තිය අනුව 1982 ජනවාරි මස 18 දින පත් කරනලද මණ්ඩලීය ලේකම් තැනට පාලක මණ්ඩලය විසින් 1982 ඔක්තෝම්බර් මස 01 වෙනි දින සිට වැටුප් වැඩිවීම් පහක් ප්‍රදානය කර තිබුනි.

3:4 **පර්යේෂණ වැඩ සටහන:**

1981 සැප්තැම්බර් මාසයේ සිට නියෝජ්‍යායතනය කටයුතු ආරම්භ කරන්නට යෙදුනු නමුත්, විද්‍යාත්මක හා කාර්මික කාරක සභාව විසින් පර්යේෂණ වැඩ සටහනක් තීරණය කර අනුමත කර තිබුනේ 1982 මැයි මාසයේ සිටය.

4. **පද්ධති හා පාලන:**

(අ) පද්ධතීන් හා පාලනයන් ඇතිතරම හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විගණනයේදී දක්නට ලැබුන අඩුලුහුඩුකම් මා විසින් පාලක පක්ෂය වෙත ඉදිරිපත් කරන ලද විස්තරාත්මක වාර්තාවේ දක්වන්නට යෙදුනි. ඒවා පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් වේ.

I. බලතල පැවරීම.
II. අභ්‍යන්තර පාලනය.
III. මුදල්
IV. ස්ථාවර වත්කම්
V. සේවක ඇප
VI. අයවැය ලේඛණය
VII. සේවක මණ්ඩල
VIII. පර්යේෂණ වැඩ සටහන
IX. මෝටර් වාහන

(ආ) **කාර්ය සංවිධාන සංග්‍රහය:**

තම කාර්යයන් කරගෙන යාම සඳහා නියෝජ්‍යායතනය විසින් ක්‍රියා මාර්ගයක් හා නීති හා රීතීන් පනවා නොතිබුණි.

(ඇ) **අභ්‍යන්තර විගණනය:**

1982 මැයි මස 4 වෙනි දින සිට අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර ඇතත්, මුදල් පනතේ 12(5) (සී) වගන්තිය ප්‍රකාරව මගේ අනුමතිය සඳහා අභ්‍යන්තර විගණන වැඩ සටහනක් ඉදිරිපත් කර නොතිබුනි. තවද, ඉල්ලා යවන ලද නමුත් අභ්‍යන්තර විගණන වාර්තාවක්ද විගණනයට ඉදිරිපත් කර නොතිබුනි. අභ්‍යන්තර විගණන නිලධාරියා වෙත තමා පත්වූ දින සිට පරිපාලන නිලධාරී තැනගේ රාජකාරිවල යෙදී සිටින බව දක්නට ලැබුන අතර, මෙම කාර්යයන්හි නිරතවීම වෙනුවෙන් ඔහුට මසකට රු.750/- ක අතිරේක දීමනාවක් ගෙවනු ලැබේ.

අ.ක.පැහැදිලි නැත.
වැඩ බලන විගණකාධිපති

## ජාතික ජලජ සම්පත් නියෝජිතායතනය මට්ටක්කුලිය

### 1982 දෙසැම්බර් 31 දිනින් අවසන්වූ වර්ෂය සඳහා ආදායම හා වියදම පිළිබඳ ගිණුම

| | | | |
|---|---|---|---|
| වර්ෂය සඳහා දායක මුදල | | | 7,800,000.00 |
| විවිධ ආදායම | | | 1,499.75 |
| | | | 7,801,499.75 |
| **පුනරාවර්තන වියදම** | | | |
| **පරිපාලන වියදම්** | | | |
| වැටුප් | 1,788,073.86 | | |
| දීමනා | 681,413.04 | | |
| සේවක අර්ථසාධක අරමුදල (සේ.භා.අ.) | 211,153.44 | | |
| අතිකාල | 64,410.24 | | |
| විශ්‍රාම දායක මුදල | 14,793.50 | | |
| ගමන් වියදම් | 42,867.36 | | |
| ආරක්ෂක ගාස්තු | 87,537.24 | | |
| ගාස්තු | 11,707.75 | | |
| ඉන්ධන | 38,042.33 | | |
| නිල ඇඳුම් | 4,650.00 | | |
| උපදේශක ගාස්තු | 26,596.77 | | |
| දැන්වීම් පළකිරීම | 73,987.39 | | |
| ලිපිද්‍රව්‍ය | 124,408.98 | | |
| තැපැල් ගාස්තු | 11,019.80 | | |
| සංග්‍රහ කිරීම | 30,384.50 | | |
| සුභ සාධනය | 9,397.33 | | |
| දුරකථන | 42,892.58 | | |
| විවිධ | 32,506.55 | 3,295,542.66 | |
| **ආයතන වියදම්** | | | |
| නඩත්තුව | 265,908.81 | | |
| විදුලිබලය | 164,158.33 | | |
| පාරිභෝජන හා විදුරුබඩු | 134,459.00 | | |
| බදු හා වරිපනම් | 11,353.00 | | |
| ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන | 1,929.00 | | |
| වෙනත් ප්‍රතිපාදන | - | 577,808.14 | 3,873,350.80 |
| වියදමට වැඩි ආදායම | | | 3,928,148.95 |

අත්සන් කලේ/
(ආචාර්ය ඩබ්.ජයවර්ධන)
සභාපති
1983 සැප්තැම්බර් 19

අත්සන් කලේ/
(ආචාර්ය එච්.ජේ.එනිල් පෙරේරා)
සභාපති
1983 සැප්තැම්බර් 19

## 1982.12.31 දින පැවති අයුරු ශේෂ පත්‍රය

| | | | |
|---|---|---|---|
| **දායක මුදල** | | | |
| 1981 වර්ෂය සඳහා | | | 7,134,000.00 |
| 1982 වර්ෂය සඳහා | | | 7,800,000.00 |
| මුළු දායක මුදල | | | 14,934,000.00 |
| **යොදවාගත් දායක මුදල** | | | |
| 1982.01.01 පැවති අයුරු ඉදිරියට ගෙනෙන ලද ශේෂය | | | 6,416,067.01 |
| 1982 වර්ෂය සඳහා ශේෂ | | | 3,928,148.95 |
| | | | 10,344,215.96 |
| දායක මුදල යෙදවීම | | | |
| **ස්ථිර වත්කම් (මූලධන වියදම්)** | | | |
| ගොඩනැගිලි | 2,149,948.16 | | |
| යන්ත්‍රෝපකරණ | 478,761.79 | | |
| වාහන | 653,863.09 | | |
| ලී බඩු | 171,537.05 | | |
| පුස්තකාල පොත් සහ සඟරා | 79,235.80 | | |
| විශේෂ ව්‍යාපෘතිය | 350,000.00 | | |
| ගමන් වියදම් හා යැපීම් දීමනා | 162,691.62 | | |
| ඉන්ධන | 109,648.65 | | |
| විදේශ ගමන් | 145,012.90 | | |
| විදුරුභාණ්ඩ හා පාරිභෝජ්‍යයන් | 134,623.74 | 4,435,322.80 | |
| අඩුකරන්න ක්ෂයවීම සඳහා ප්‍රතිපාදනය | | 1,929.00 | 4,433,393.80 |
| **ප්‍රවර්තන වත්කම්** | | | |
| විවිධ ණය කරුවන් (උප 01) | 5,203,295.51 | | |
| තැන්පතු (උප 02) | 22,500.00 | | |
| අත්තිකාරම් හා තැන්පතු (උප03,04,05,06,07) | 78,390.85 | | |
| බැංකු හා මුදල් | 945,912.88 | 6,250,099.24 | |
| **අඩුකරන්න ප්‍රවර්තන [illegible]** | | | |
| ණය හිමියන් හා එකතුවූ වියදම් (උප08,09) | 331,556.33 | | |
| තැන්පතු (උප 10) | 7,720.75 | 339,277.08 | 5,910,822.16 |
| | | | 10,344,215.96 |

අත්සන් කලේ/
(ආචාර්ය හිරාන් ඩබ්ලිව්. ජයවර්ධන)
3 සැප්තැම්බර් 19

අත්සන් කලේ/
(ආචාර්ය එස්. කේ. ඔනිල් පෙරේරා)
1983 සැප්තැම්බර් 19